ජාතික අයවැය දෙපාර්තමේන්තුව
தேசிய வரவுசெலவுத்திட்டத் திணைக்களம்
DEPARTMENT OF NATIONAL BUDGET

මහා භාණ්ඩාගාරය
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය,
කොළඹ 01.

பொது திறைசேரி
நிதி, திட்டமிடல் அமைச்சு
கொழும்பு 01.

General Treasury
Ministry of Finance and Planning
Colombo 01.

අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் அதிபதி / Director General: 2484665, 2484639 (Fax)

අතිරේක අධ්‍යක්ෂ ජනරාල් / மேலதிக பணிப்பாளர் அதிபதி / Additional Director General: 2484666, 2484667

කාර්යාලය / அலுவலகம் / Office: 2484500, 2484600, 2484700

ෆැක්ස් / பெக்ஸ் / Fax: 2484691

Web site: www.treasury.goy.lk

e-mail:budget@nbd.treasury.gov.lk

මගේ අංකය / எனது இல / My No.: බඩ/පඔබ්ප්/පපල්පස්/4

ඔබේ අංකය / உமது இல / Your No.:

දිනය / திகதி / Date: 2007.06. 29

අයවැය චක්‍රලේඛ අංක : 132 (II)

අමාත්‍යාංශ ලේකම් වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්,
දිස්ත්‍රික් ලේකම් වරුන්,

**රාජ්‍ය සේවකයන්ට මෝටර් රථයක්, මෝටර් සයිකලයක් / ස්කූටරයක්**
**<u>මිලදී ගැනීම සඳහා බැංකුවෙන් ණය ලබාදීම - ගිණුම් තැබීමේ උපදෙස්</u>**

උක්ත කරුණ සම්බන්ධයෙන් 2006.08.16 දිනැති අයවැය චක්‍රලේඛ 132 හා 2007.02.14 දිනැති අයවැය චක්‍රලේඛ 132 (1) චක්‍රලේඛනවල සඳහන් ගිණුම් උපදෙස් වලට අමතරව පහත සඳහන් ගිණුම් උපදෙස්ද 2007.06.15 වන දින සිට ක්‍රියාත්මක කළ යුතුවේ

1 රජයේ සේවකයින්ගෙන් අයකරනු ලබන පොලිය

I. 2007.06.15 වන දිනට පෙර රජයේ සේවකයින්ට බැංකුවෙන් නිදහස් කළ ණය මුදල සඳහා එම ණය මුදල ගෙවා අවසන් වනතුරු සේවකයාගෙන් අයකළ යුතු පොලිය 4% කි.

II. 2007.06.15 වන දිනෙන් පසු බැංකු මගින් නිදහස් කරන ණය මුදල් සඳහා 2007.06.12 වන දිනැති රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක : 15/2007 හි 2.1.1(අ) වන වගන්තියට අනුකූලව පොලී අයකළ යුතුය. ඒ අනුව 2007 ජූනි 15 වන දින සිට භාණ්ඩාගාරය නැවත දැනුම් දෙන තුරු සේවකයාගෙන් අයකරනු ලබන වාර්ෂික පොලී අනුපාතිකය 11% කි.

2. බැංකු සඳහා ගෙවිය යුතු පොලිය

රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය විසින් නිකුත් කළ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 15/2007 හි 2.1 වන වගන්තියට අනුව :

I. 2007 ජුනි 15 වන දිනට පෙර බැංකුව විසින් වාහන ණය වෙනුවෙන් නිදහස් කර ඇති ණය මුදල් වලට අදාල බැංකුවලට ගෙවිය යුතු වාර්ෂික පොලී අනුපාතිකය වන 11%, තවදුරටත් නොවෙනස්ව පවතිනු ඇත.

II. 2007.06.15 වන දිනට පසු බැංකුව නිදහස් කල ණය සඳහා භාණ්ඩාගාරය නැවත දැනුම් දෙන තුරු වර්ෂයකට 14.5% පොලියක් බැංකු වෙත ගෙවිය යුතුය.

3. 2007.06.15 පසු නිදහස් කල ණය වෙනුවෙන් අදාල වාරිකය හා එයට අදාල පොලී පිළිබඳ විස්තර ලබාගැනීම හා ගිණුම් තැබීම :

I. අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් සේවකයාගෙන් අයකල යුතු පොලිය හා රජය විසින් දැරිය යුතු පොලී සහනාධාරය තීරණය කිරීම සඳහා මෙම චක්‍රලේඛයට අමුණා ඇති උපලේඛණ 1 ට අනුකූලව බැංකුවෙන් සෑම වර්ෂයකටම අදාල විස්තර ලබාගත යුතු වේ.

II. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 15/2007 හි 2.2 වගන්තියට අනුව බැංකුවට ගෙවිය යුතු වර්ෂයකට 14.5% ක් වූ පොලිය හා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 2.1 වගන්තියට අනුව සේවකයාගෙන් අයකරන වර්ෂයකට 11% ක පොලී අනුපාතිකය අතර වෙනස රජය විසින් ගෙවිය යුතු පොලී සහනාධාරය ලෙස සැලකේ. මෙම චක්‍රලේඛයේ උපලේඛන අංක 1 අනුව ලබාගත් තොරතුරු මත රජය විසින් ගෙවිය යුතු පොලී සහනාධාරය හා සේවකයාගෙන් අයකල යුතු පොලිය නිවැරදිව ගණනය කිරීම අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවල විෂය භාර නිලධාරීන්ගේ වගකීම වේ.

III. 2006.08.16 වන දින දරණ අයවැය චක්‍රලේඛ 132 හි හා 2007.02.14 දින දරණ අයවැය චක්‍රලේඛ 132(1) ට අනුකලව ගිණුම් තැබීම සිදුකල යුතු වේ.

4. මෙම චක්‍රලේඛයේ උපදෙස් ක්‍රියාත්මක කිරීමේදී යම් ප්‍රායෝගික ගැටළුවක් ඇත්නම්, ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගෙන් ඒ පිළිබඳව ලිඛිත උපදෙස් ලබාගත යුතු වේ.

සුධර්මා කරුණාරත්න
ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල්.

පිටපත් :

1. ලේකම් - රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය
2. සියළුම පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්
3. අධ්‍යක්ෂ ජනරාල් - භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව
4. අධ්‍යක්ෂ ජනරාල් - රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව
5. විගණකාධිපති.

උපලේඛන අංක : 01

........................................
........................................
........................................ (ලිපිනය)

## ණය වාරික හා පොලී අයකිරීම පිළිබඳ මාසික විස්තර ලබාදීම

1. නිලධාරියාගේ නම : ..............................................................................
2. ණය ගිමිකම් අංකය : ..............................................................................
3. සේවා ස්ථානයේ ලිපිනය : ..............................................................................
   ..............................................................................
4. ප්‍රදානය කල ණය මුදල : රු. ..............................................................................
5. ........................................ දිනට ගෙවීමට ඇති ණය මුදලේ ඉතිරි ශේෂය රු. .................

| වර්ෂය | මාසය | මාසික ණය වාරිකය (පොලීය හා ණය මුදලින් අඩුවන ප්‍රමාණය) | මාසිකව අයවන පොලිය (වර්ෂයකට14.5% බැගින් ) | මාසිකව ණය මුදලින් අඩුවන මුදල | මාසය අවසානයේ ගෙවීමට ඇති ණය මුදලේ ඉතිරිය |
|---|---|---|---|---|---|
| | ජනවාරි | | | | |
| | පෙබරවාරි | | | | |
| | මාර්තු | | | | |
| | අප්‍රේල් | | | | |
| | මැයි | | | | |
| | ජූනි | | | | |
| | ජූලි | | | | |
| | අගෝස්තු | | | | |
| | සැප්තැම්බර් | | | | |
| | ඔක්තෝම්බර් | | | | |
| | නොවැම්බර් | | | | |
| | දෙසැම්බර් | | | | |

බැංකු කළමනාකරු

දිනය :